වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

| 29 | S | I |
|---|---|---|

**නම :**

**කාලය : පැය 2 යි.**

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**01. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙසින් ආරම්භ වූයේ,**

(i) යුරෝපය කේන්ද්‍ර කර ගනිමිනි (ii) ආසියාව කේන්ද්‍ර කර ගනිමිනි
(iii) බටහිර යුරෝපය කේන්ද්‍ර කර ගනිමිනි (iv) ඇමරිකාව කේන්ද්‍ර කර ගනිමිනි
(v) චීනය කේන්ද්‍ර කර ගනිමිනි.

**02. අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂව පෙළඹවීමේ හැකියාව වැඩිම සන්නිවේදන ප්‍රභේදය තෝරන්න.**

(i) අන්තර්වර්ති සන්නිවේදනය (ii) සමූහ සන්නිවේදනය
(iii) දෘෂ්‍ය සන්නිවේදනය (iv) අන්තර් පුද්ගල සන්නිවේදනය
(v) නිර්මාණාත්මක සන්නිවේදනය

**03. සන්දේශයක පවතින පොදු සංඥා සංකේත ග්‍රහණය කර ගනු ලබන්නේ,**

(i) ආකේතකරණයයි (ii) අකේතකරයයි (iii) විකේතකරණයයි
(iv) සන්දර්භයයි. (v) විකේතකරයයි

**04. සන්නිවේදනය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

(i) සන්නිවේදනය දෛනික ජීවිතය හා සම්බන්ධ වූවකි.
(ii) අදහස් හා සංකල්ප පිළිබඳ දූනුම පුළුල් වීමට භාෂා සම්භවය බලපාන ලදී.
(iii) සාමාන්‍ය සන්නිවේදනයේ දී නාලිකාව පුද්ගල පංචේන්ද්‍රියයි.
(iv) තොරතුරු ගබඩා කර ගැනීමට පදනම සකස් වූයේ ලේඛනයේ ආරම්භයත් සමඟිනි.
(v) පුද්ගල සමාජ ගැටුම් ඇති වීමෙහිලා සාර්ථක සන්නිවේදනය බලපානු ලබයි.

**05. පහතින් දක්වා ඇති තොරතුරු අතරින් ජනමාධ්‍ය තුළ දොරටුපාල ක්‍රියාවලියක අවම වශයෙන් නියැලෙන්නේ,**

(i) සොදුපත් බලන්නා (ii) අධ්‍යක්ෂකවරයා (iii) සංස්කාරක
(iv) වාර්තාකරු (v) ප්‍රධාන කතුවරයා

**06. වර්තමානයේ දරුවන් හා දෙමාපියන් අතර සබඳතා දුරස් වීමටත්, දරුවන් ඉක්මණින් ආක්‍රමණශීලි වන්නටත් ප්‍රධාන වශයෙන් බලපෑම් කරන ජනමාධ්‍ය වන්නේ,**

(i) පොත් (ii) පුවත්පත් (iii) ගුවන් විදුලිය
(iv) රූපවාහිනිය (v) සමාජ මාධ්‍යයය

07. **සුසන්ත ඊයේ තමා දුටු සිදුවීමක් රස කරමින් සිය මිතුරන් පිරිසකට පන්ති කාමරයේ දී කියනු සෙනුර දකින ලදි. මෙහිදී සුසන්ත නියැලුණු සන්නිවේදන ස්වරූපය වන්නේ,**

(i) අවිධිමත් සන්නිවේදනය
(ii) වාචික සන්නිවේදනය
(iii) ශ්‍රව්‍ය සන්නිවේදනය
(iv) දෘෂ්‍ය සන්නිවේදනය
(v) විධිමත් සන්නිවේදනය

08. **මැක්බ්‍රයිඩ් කොමිසම ආරම්භ කරන ලද්දේ,**

(i) ගෝලීය මාධ්‍ය නිරූපණය වඩාත් සාධාරණීකරණය කිරීම සඳහා ය.
(ii) සන්නිවේදන අසමතුලිතා දුරු කිරීම සඳහා ය.
(iii) සන්නිවේදන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ය.
(iv) ලෝක මාධ්‍ය නියාමනය සඳහා ය.
(v) නොබැදි රටවල් අතර ප්‍රවෘත්ති හුවමාරු ක්‍රමවේදය ගොඩනැගීම සඳහා ය.

09. **මහාචාර්ය විල්බර් ශ්‍රාම් ප්‍රකාශ කරන ලද්දේ,**

(i) සන්නිවේදනය ඒකමාර්ගික බව ය.
(ii) සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව ය.
(iii) සන්නිවේදනය සන්දර්භානුගත ය.
(iv) සෑම සන්නිවේදනයක් තුළම බලපෑමක් වන බව ය.
(v) සන්නිවේදනයේ දී ග්‍රාහකයා වඩා වැදගත් බව ය.

10. **ප්‍රතිපෝෂණ ක්‍රියාවලියේ ප්‍රයෝජනයක් නොවන්නේ,**

(i) සන්දේශය ග්‍රාහකයා වෙත ලැබුනේ ද යන්න ස්ථිරව දැන ගත හැකි වීම.
(ii) සංදේශයේ අඩුපාඩු සකස් කරගෙන ප්‍රතිසංවිධානය කර ගත හැකි වීම.
(iii) පණිවිඩය පෝෂණය කර ගත හැකි වීම
(iv) සංදේශයේ සාර්ථක අසාර්ථක බව දැන ගත හැකි වීම
(v) ග්‍රාහකයා හා සන්නිවේදකයා අතර අවම සම්බන්ධයක් ඇති කර ගත හැකි වීම.

11. **මලලසේකර ශබ්දකෝෂය Virtual යන වචනයට දී ඇති අරුතක් නොවන්නේ,**

(i) නාමිකව නොවූ
(ii) අතාත්වික
(iii) කයක් නැති
(iv) අර්ථත්‍යතාව
(v) තථ්‍යතාව

12. **පරිකල්පනය වඩාත් හොඳින් පුබුදු කළ හැකි නූතනා මාධ්‍ය වන්නේ,**

(i) සිනමාව
(ii) රූපවාහිනිය
(iii) ගුවන් විදුලිය
(iv) පුවත්පත
(v) නව මාධ්‍යය

13. **හැරල්ඩ් ඩී. ලැස්වෙල් දක්වන ජන මාධ්‍ය කාර්යයන් අතරට අයත් වන්නේ මින් කුමක් ද ?**

(i) සුපරීක්ෂණය
(ii) අර්ථකථනය
(iii) සහසම්බන්ධය
(iv) සමාජානුයෝජනය
(v) අධ්‍යාපනය

14. **ඩබ්. ජේම්ස් පෝටර් දක්වන උසස් මාධ්‍ය සාක්ෂරතාවයක් ලබා ගැනීමේ ප්‍රයෝජනයක් වන්නේ,**

(i) මාධ්‍ය අධ්‍යාපනය ලබා ගත හැකි ය.
(ii) මාධ්‍ය සීමා කළ හැකි ය.
(iii) මාධ්‍ය කර්මාන්තය හැඳැරිය හැකි ය.
(iv) මානසික චර්යා පද්ධතිය පාලය කිරීමේ හැකියාව
(v) නිෂ්ක්‍රීය ග්‍රාහකයෙක් විය හැකි ය.

**15. සංස්කෘතිය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශයක් වන්නේ,**

(i) මෙම වචනය කෘෂිකර්මාන්තය සඳහා මුලින් භාවිත කරන ලද්දේ මාර්කස් පර්සියස් කැටෝ ය.

(ii) චීන ජාතිකයන් සංස්කෘතිය භාෂාවේ සංස්කෘතිය, හැසිරීමේ සංස්කෘතිය, ආගම් සංස්කෘතිය, ආදී වශයෙන් යොදා ගන්නා ලදි.

(iii) සංස්කෘතිය යන වචනය ප්‍රථම වරට සංකල්පයක් ලෙස භාවිතයට පැමිණියේ 17 වන සියවසේ දී ය.

(iv) මාර්කස් ටුලිස් සිසරෝ මානව අධ්‍යාත්මික තත්ත්වයට අසාර්ථක තත්ත්වයට අදාළව සංස්කෘතිය යන වචනය භාවිත කරන ලදි.

(v) සමාජයක එකිනෙක පුද්ගලයන් ඔවුන්ගේ සංවර්ධන ඉලක්ක ගන්නා කාර්ය මාලාවක් ලෙසින් සංස්කෘතිය දක්වාලිය හැකි ය.

**16. ඊ.බී. ටයිලර්ගේ සංස්කෘතිය පිළිබඳ නිර්වචනයේ අඩංගු නොවන සංස්කෘතිය අංගයක් වනුයේ,**

(i) දැනුම (ii) ඇදහිලි (iii) ශිල්පය හා විශ්වාසය

(iv) කලා හා නීති (v) සදාචාර හා සිරිත් විරිත්

**17. මාධ්‍ය සංස්කෘතිය සමකාලීන සමාජයෙහි ඉටු කරන කාර්යයක් නොවන්නේ,**

(i) විඥාපන කාර්යය (ii) සන්නිවේදනාත්මක කාර්යය

(iii) විචාරශීලී කාර්යය (iv) ප්‍රතිෂ්ඨාපන කාර්යය

(v) අනුකලනාත්මක කාර්යය

**18. නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබලව හා කලාත්මකව භාවිත කළ හැකි මාධ්‍යයක් වන්නේ,**

(i) රූපවාහිනිය (ii) නව මාධ්‍යය (iii) ගුවන් විදුලිය

(iv) සිනමාව (v) සමාජ මාධ්‍යය

**19. පුද්ගලයෙකුට සන්දේශයක් ඇගයීමට හා නිර්මාණය කිරීමට හැකියාවයක් ඇති වන්නේ,**

(i) සංජානනය තුළිනි (ii) සහවේදනය තුළිනි. (iii) විචාරය තුළිනි

(iv) සාක්ෂරතාවය තුළිනි (v) පරිහරණය තුළිනි.

**20. 'මාධ්‍යයම සන්දේශය වේ.' මෙම ප්‍රකාශය තුළින් තහවුරු වන්නේ කුමක් ද ?**

(i) මාධ්‍ය ඒකාකෘතිකරණය පිළිබඳවයි.

(ii) මාධ්‍ය ආධිපත්‍ය පිළිබඳවයි.

(iii) මාධ්‍ය සතු පෙළඹවීමේ ශක්‍යතාවය පිළිබඳවයි.

(iv) සන්දේශයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳවයි.

(v) මාධ්‍ය හා සන්දේශ අතර පවතින සබඳතාවය පිළිබඳවයි.

**21. අන්තර්ජාලයේ පැමිණීම ආදිය සමඟින් පුද්ගලයාට ඉතා ඉහළ ප්‍රකාශනයේ නිදහසක් හිමිව ඇත. මෙම තත්ත්වය ඇති වීමෙහිලා මූලික පදනම වූයේ,**

(i) මාධ්‍ය තාක්ෂණයයි. (ii) මාධ්‍ය ආධිපත්‍යයයි

(iii) නව මාධ්‍ය වර්ධනයයි. (iv) සමාජ මාධ්‍ය වර්ධනයයි.

(v) මාධ්‍ය බලයයි.

**22. පුද්ගල ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී වඩාත් වැදගත් වන සන්නිවේදන කාර්ය වන්නේ,**

(i) අධ්‍යාපනය (ii) විනෝදාස්වාදය (iii) උපදෙස් සම්පාදනය

(iv) පෙළඹවීම (v) තොරතුරු

**23. හින්දු සංස්කෘතියේ පැවතෙන වඩිමෝඩි, තෙන්මෝඩි ආදි ශාන්තිකර්ම පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය වන්නේ,**

(i) විනෝදාර්ථය වෙනුවෙන් පවත්වනු ලබයි.
(ii) පැපොළ වැනි රෝගීන් වෙනුවෙන් පවත්වනු ලබයි
(iii) මේවා සශ්‍රීකත්වය වර්ධන ශාන්තිකර්මයන් ය.
(iv) මේවා හින්දු සංස්කෘතියේ නර්තනයන් ලෙස භාවිත කරයි.
(v) ගොවිතැන් කටයුතු සාර්ථක කර ගැනීමට පවත්වයි.

**24. චිත්‍රපට නිෂ්පාදනයේ දී පූර්ව නිෂ්පාදන අදියර තුළදී සිදු කරන කාර්යයක් නොවන්නේ,**

(i) තිර රචනය කිරීම
(ii) නලු නිළියන් තෝරා ගැනීම
(iii) සංස්කරණය
(iv) දර්ශන තල තෝරා ගැනීම
(v) පසුතල සකස් කර ගැනීම

**25. සංස්කරණයේ දී භාවිත කරන නිර්මාණශීලි භාවිතයක් නොවන්නේ,**

(i) ආලෝකයෙන් අඳුරට යෑම
(ii) කැපීම
(iii) වියැකීම
(iv) මිශ්‍ර කිරීම
(v) කැමරාව තිරස්ව වමට හො 'දකුණට ගෙන යාම.

**26. නිර්මාණයක් බිහි කිරීමෙහි ලා නිර්මාණකරුවෙකු සතු හැකියාව හා ශක්තිය හඳුන්වන්නේ,**

(i) පරිකල්පනය
(ii) නිර්මාණශිලිත්වය
(iii) නිර්මාණාත්මක චින්තනයයි.
(iv) සංජානනයයි.
(v) අත්දැකීම් ප්‍රතිචින්දනයයි

**27. පුවත්පතක විශේෂාංගයක් නොවන්නේ,**

(i) තීරු ලිපි
(ii) සංස්ලේඛය
(iii) කෙටිකතා
(iv) ප්‍රවෘත්ති
(v) චිත්‍ර කතා

**28. ජනතා කේන්ද්‍රීය සංවර්ධනය සඳහා ඉදිරිපත්ව ඇති සන්නිවේදන මූලධර්ම අතරට අයත් නොවන්නේ,**

(i) යහ පැවැත්ම ප්‍රවර්ධනය
(ii) සමාජ සංස්කෘතික විවිධත්වය පිළිබඳ සංවේදිතාවය
(iii) මූලික වෙනස්කම් සිදු කිරීම / පිළිගැනීම
(iv) අඛණ්ඩ පෞද්ගලික සම්බන්ධතා
(v) අයිතීන් හා වගකීම්

**29. ගැටුම් නිරාකරණය යටතේ දිය හැකි නිවැරැදිව අරුත වන්නේ,**

(i) ගැටුම සම්පූර්ණයෙන් විසඳීම
(ii) ගැටුම් මැඩ පැවැත්වීම
(iii) ගැටුම සඳහා තෙවන පාර්ශවීය මැදිහත්කරුවෙකු භාවිත කිරීම
(iv) පවත්නා මතභේදයට සමකාමී විසඳුමක් සොයා ගැනීම
(v) ගැටුමට හේතු සෙවීම

**30. මාධ්‍යයේ ගුණාත්මකභාවයෙන් අපේක්ෂා කරන අරමුණු අතරට අයත් නොවන්නේ මින් කුමක් ද ?**

(i) මාධ්‍ය අධ්‍යාපනය
(ii) සෞඛ්‍යය
(iii) සුළු ජන සවිබල ගැන්වීම අවම කිරීම
(iv) ආපදා සහන
(v) දූෂණය පිටු දැකීම

**31. ප්‍රාදේශීයකරණය යනු කුමක්දැයි ඉදිරිපත්ව තිබූ අදහස් අතරින් නිදොස් ප්‍රකාශය තෝරන්න.**

(i) ඒ ඒ රටවලට ගැළපෙන ලෙස සංවර්ධනය ඒ ඒ රටවලට කර ගැනීමයි.
(ii) ප්‍රදේශ ලෙස සංවර්ධනයයි.
(iii) සෑම ප්‍රදේශයකට ම සම අයිතිය පැවැත්වීමයි
(iv) ප්‍රදේශ වශයෙන් දරිද්‍රතාවය අවම කිරිම සහ ආර්ථික වර්ධනය ඇති කිරිමයි
(v) සංවර්ධනයට ජනතාව සහභාගි කර ගැනීමයි.

**32. නවෝත්පාදන විසරණය නමැති න්‍යාය හඳුන්වා දෙනු ලැබූයේ,**

(i) විල්බර් ශ්‍රාම් (ii) එවරට් එම්. රොජර්ස් (iii) ඩිෆ්ලූවර් හා ඩෙනිස්
(iv) තෝමස් බොග් (v) කාල් මාක්ස්

**33. ශ්‍රීනිවාස් මෙල්කොට් සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳව ඉදිරිපත් කළ නිර්වචනය තුළ අඩංගු කරුණක් නොවන්නේ,**

(i) විචාරාත්මක සිද්ධාන්ත මඟින් මානව සමාජ ගැටලුවලට විසඳුම් සැපයීම
(ii) මිනිසාගේ ඉතිහාසය ක්‍රියාවලියක් බව වටහා ගැනීම
(iii) ආගමික බැඳීම්වලින් තුන්වන ලෝකය විමුක්තිය ලබා ගැනීම
(iv) පුද්ගල හා සමාජ හැසිරීම් වෙනස් කිරීමේ වැසටහන්වලට ප්‍රමුඛතාවය දීම
(v) සන්නිවේදන සහ සමාජ ව්‍යුහය පිළිබඳ සම්බන්ධතා වැඩිදියුණු කිරිම

**34. ප්‍රකාශන කළමනාකරණයේ දී යොදා ගත හැකි මහජන සම්බන්ධතා විධි ක්‍රමයක් වන්නේ,**

(i) අත් පත්‍රිකා සහ අභ්‍යන්තර සඟරා ය.
(ii) මාධ්‍ය සාකච්ඡා හා පුවත් නිවේදනය
(iii) ඡායාරූපය හා අභ්‍යන්තර ඇමතුම් ය.
(iv) ලිපි යැවීම හා අනුග්‍රාහකත්වයයි
(v) සුහද හමු හා වාර්ෂික චාරිකා

**35. මහජන සම්බන්ධතා අතර ආචාර විද්‍යාවේ ඇති වැදගත්කම පෙන්වා දෙනු ලැබූයේ,**

(i) අයිවි ලී (ii) එල්ම ඩේවිස් (iii) සෑම් බ්ලැක්
(iv) පිලිප් ජේ. කිචන් (v) එඩ්වඩ් එල්. බර්ණිස්

**36. ග්‍රීකවරුන් හා රෝමවරුන් ස්වකීය සංස්කෘතික ප්‍රවර්ධනය සඳහා මහජන සම්බන්ධතා කුසලතා උපයෝගි කරගත් බවට නිදසුනක් වන්නේ මින් කුමක් ද ?**

(i) කලා කටයුතුවලට උපදෙස් දීම
(ii) සාහිත්‍යකරණයට අවශ්‍ය පහසුකම් ලබා දීම
(iii) රන් රිදී වැනි තෑගි ලබා දීම
(iv) කාව්‍යකරණයට මතවාද ගොඩ නැගීමට අවස්ථාව උදා කර දීම
(v) ග්‍රන්ථ සම්පාදනයට අවස්ථාව ලබා දීම

**37. සමාජ මාධ්‍ය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,**

(i) නව මාධ්‍යවල දියුණු අවස්ථාවකි
(ii) සමාජ මාධ්‍යවල දත්ත කිසිවෙකුට සොයා ගත නොහැක.
(iii) දුරකථනය හා අන්තර්ජාලය මෙහි ප්‍රභව අංග වේ.
(iv) පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් අතර සංදේශ හුවමාරු කර ගත හැකිය.
(v) තොරතුරු සම්පාදනය සමාජ මාධ්‍යයේ කාර්යයක් ලෙස දැක්විය හැකි ය.

**38. නව මාධ්‍යය ප්‍රභේදයක් නොවන්නේ,**

(i) වෙබ් අඩවි (ii) සමාජ මාධ්‍යය (iii) විද්‍යුත් තැපැල
(iv) ඡායාරූප (v) බ්ලොග්ස්

**39. නූතන මාධ්‍ය පිළිබඳ සාවද්‍ය අදහසකි.**

(i) සියලු මාධ්‍ය ගොඩ නැගීම් ය.
(ii) එක් එක් පුද්ගලයා සංදේශ විවිධාකායෙන් අර්ථ දක්වයි
(iii) මාධ්‍යයට වාණිජ ලැදිකමක් නොපවතී
(iv) මතවාදී අගයන් සහිත සංදේශ මාධ්‍ය දරා සිටී
(v) ඒ ඒ මාධ්‍යයන් සතු භාෂාවක් අලංකාර ශිල්ප ක්‍රම, කේත සම්මුති හා සෞන්දර්යයන් පවතී.

**40. පහතින් දක්වා ඇත්තේ මාධ්‍ය සාක්ෂරතාවයේ අවශ්‍යතාවය පිළිබඳ ඉදිරිපත් වූ අදහස් කිහිපයකි.**

A - ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙක් වශයෙන් ජීවත් වීම සඳහා
B - පුද්ගලයින්ගේ දෛනික න්‍යාය පත්‍රය යථාර්ථවාදීව ගොඩ නගා ගැනීමට
C - ජනප්‍රිය සංස්කෘතියෙන් වන අවපැවැත්ම හසුරුවා ගැනීම සඳහා

**මේ සඳහා නිදොස් ප්‍රකාශයක් වන්නේ,**

(i) A පමණි (ii) B පමණි (iii) A C පමණි
(iv) ඉහත සියල්ලම ය. (v) B හා A පමණි.

**41. පහත A හා B කොටස් සැලකිල්ලට ගන්න.**

| A | | B |
|---|---|---|
| A | හැරල්ඩ් ලැස්වෙල් | 1. අධ්‍යාපනඥයෙකි. |
| B - | ඇරිස්ටෝටල් | 2. ගණිතඥයෙකි. |
| C - | ක්ලෝඩ් ෂැනන් | 3. දේශපාලන විද්‍යා මහාචාර්යවරයක් |
| D - | මාර්ක් සකර්බර්ග් | 4. දාර්ශනිකයෙකි. |
| E - | ජෝන් ඩුවි | 5. Face Book නිර්මාතෘය. |

**ඒ අනුව පුද්ගලයා හා ක්ෂේත්‍රය අතර මහා සම්බන්ධතාවයක් පෙන්වන වරණය වන්නේ,**

(i) A3, B4, C2, D5, E1 (ii) A4, B3, C1, D5, E2 (iii) A1, B2, C4, D5, E3
(iv) A5, B4, C3, D2, E1 (v) A2, B1, C4, D5, E3

**42. පහතින් දක්වා ඇති සංවිධාන සැලකිල්ලට ගන්න.**

A - ආහාර හා කෘෂිකර්ම සංවිධානය
B - එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාව හා සංස්කෘතික සංවිධානය
C - යුනිසෙෆ් සංවිධානය
D - සාර්ක් සංවිධානය
E - ලෝක සෞඛ්‍ය සංවිධානය

**මෙම සංවිධාන අතරින් සංවර්ධනය සඳහා සන්නිවේදන අවශ්‍යතා කොරෙහි තම අවධානය යොමු කර ඇති ආයතන ද්විත්වය වන්නේ,**

(i) A, B පමණි (ii) A, D පමණි (iii) D, E පමණි
(iv) B, C පමණි (v) C හා D පමණි.

43. විචාරශීලි ග්‍රාහකයෙකු සතු විය යුතු කුසලතා කිහිපයක සරල අදහසක් පහත දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| A - | සන්දේශයක් තේරුම් ගත හැකි පරිදි එය කොටස්වලට වෙන් කර ගැනීමයි | 1. | විශ්ලේෂණය |
| B - | මාධ්‍ය සංදේශ කරුණුවල සමාන අසමාන කොටස් සංසන්දනය කිරීමයි. | 2. | තක්සේරුකරණය |
| C - | මාධ්‍ය සංදේශයන්හි ඇතුළත්ව ඇති දේ අනුව සිතා බලා සමස්ත රටාව හඳුනා ගැනීමයි. | 3. | කාණ්ඩකරණය |
| D - | මාධ්‍ය සන්දේශයක යෝග්‍ය සහ අයෝග්‍යතාවය තක්සේරු කිරීමයි | 4. | අනුමානය |

මේ අතුරින් අදහස හා කුසලතාවය අතර නිවැරැදි සබඳතාව පෙන්වන වරණය වන්නේ,

(i) A1, B3, C4, D2 (ii) A3, B1, C4, D2 (iii) A4, B2, C3, D1
(iv) A2, B3, C1, D4 (v) A1, B2, C2, D4

44. පහතින් දක්වා ඇත්තේ ජනශ්‍රැති කීපයකි.

| | | | |
|---|---|---|---|
| A - | තේරවිලි | 1. | විනෝදය, විවේකය, සතුට සඳහා යොදා ගනී. |
| B - | ප්‍රස්තාව පිරුළු | 2. | මේ ආශ්‍රිතව සාහිත්‍යයක් පවතී |
| C - | යාතු කර්ම | 3. | යම් උපදේශනයක් හෝ මතයක් ඉදිරිපත් කළ හැකි ය. |
| D - | ජන ක්‍රීඩා | 4. | බුද්ධිය හා දැනුම අනාවරණය කර ගත හැකි ය. |

ඒ අනුව ජනශ්‍රැති අංග හා ලක්ෂණ අතර නිවැරැදි සබඳතාවය පෙන්වන වරණය වන්නේ,

(i) A4, B3, C2, D1 (ii) A1, B2, C3, D4 (iii) A4, B2, C1, D3
(iv) A3, B4, C2, D1 (v) A2, B1, C4, D3

45. පහත A කොටස හා B කොටස සැලකිල්ලට ගන්න.

| | A | | B |
|---|---|---|---|
| A - | බලපත්‍ර ලබා දීම | 1. | ආයතනික මහජන සම්බන්ධතා |
| B - | මාධ්‍ය | 2. | ව්‍යාපාර මහජන සම්බන්ධතා |
| C - | වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම | 3. | රාජ්‍ය මහජන සම්බන්ධතා |
| D - | චර්යා ධර්ම පද්ධතිය | 4. | මාධ්‍ය මහජන සම්බන්ධතා |
| E- | ප්‍රවර්ධන වැඩසටහන් | 5 | වෘත්තීය මහජන සම්බන්ධතා |

ඉහත කරුණු අතර, නිවැරැදි සම්බන්ධතාවය පෙන්වන වරණය වන්නේ,

(i) A3, B1, C2, D5, E4 (ii) A1, B4, C5, D3, E1 (iii) A5, B2, C4, D3, E1
(iv) A2, B3, C1, D4, E5 (v) A4, B5, C3, D2, E1

46. පහත කරුණු සැලකිල්ලට ගන්න.

A - ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය
B - සන්දර්භයට උචිත ලෙස සන්නිවේදනය
C - යෝග්‍ය භාෂාවක් භාවිතය
D - නිවැරැදි උච්චාරණය

පහත කරුණු අතරින් ඵලදායි කථනයට අදාළ කරුණු වන්නේ,

(i) A, B පමණි (ii) A, B, C, D සියල්ලම (iii) A පමණි
(iv) B, C පමණි (v) D හැර ඉතිරි සියල්ලම

47. පහතින් දක්වා ඇත්තේ අපි එදිනෙදා දකින සිද්ධි කිහිපයකි.

| A | | B | |
|---|---|---|---|
| A - | විවාහ මංගල්‍යයක් | 1. | ආගමික සිද්ධි |
| B - | මැතිවරණ ජයග්‍රහණයක් | 2. | සමාජ හා ජීවන චක්‍ර සිද්ධි |
| C - | නිදහස් උත්සවයක් | 3. | අධ්‍යාපනය හා වෘත්තීය සිද්ධි |
| D - | රැකියා උසස් වීමක් | 4. | දේශපාලන සිද්ධි |
| E- | සංගීත සංදර්ශනයක් | 5 | ඒකාබද්ධ සාමුහික සිද්ධි |
| F- | ජාතික වෙසක් උත්සවය | 6 | ක්‍රීඩා හා විනෝදාත්මක සිද්ධි |

ඉහත සිද්ධි පිලිප් කොට්ලර්ගේ සිද්ධි වර්ගීකරණයට සම්බන්ධ කළ විට නිවැරැදි සබඳතාවය පෙන්වන වරණය වන්නේ,

(i) A2, B4, C5, D3, E6, F1
(ii) A3, B6, C4, D2, E5, F1
(iii) A6, B5, C2, D3, E4, F1
(iv) A4, B3, C2, D1, E5, F6
(v) A5, B4, C3, D2, E6, F1

48. පහත **A** කොටස සහ **B** කොටස සැලකිල්ලට ගන්න.

| A | | B | |
|---|---|---|---|
| A - | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත | 1. | 1951 අංක 23 |
| B - | තොරතුරු දැන ගැනීමේ පනත | 2. | 1973 අංක 5 |
| C - | බුද්ධිමය දේපල පනත | 3. | 2003 අංක 36 |
| D - | ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩල පනත | 4. | 2016 අංක 12 |

මේ පනත් අතර නිවැරැදි සබඳතාවය සහිත වරණය තෝරන්න.

(i) A2, B3, C4, D1
(ii) A1, B2, C3, D4
(iii) A3, B1, C2, D4
(iv) A2, B4, C3, D1
(v) A4, B2, C2, D1

49. සංවර්ධනයේ දී සමාජයීය සම්බන්ධතා සමානාත්මතා ගොඩ නැගීමට අදාළ ලක්ෂණයක් නොවන්නේ,

(i) සංවර්ධනය සඳහා සමාන අවස්ථා පැවතීමයි.
(ii) පන්ති බෙදීම් තුරන් කිරිමයි.
(iii) සාධාරණ හේතුන් මත වෙනස්කම් කිරිමයි
(iv) විශේෂ මානව අයිතිවාසිකම් පැවතීමයි.
(v) අවම අවශ්‍යතා සම්පූර්ණ කිරිමයි.

50. පුවත්පතක සිරස්තලය යෙදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාදැයි ගුරුතුමා ඇසූ ප්‍රශ්නයට ළමුන් ලබා දුන් පිළිතුරු කීපයක් පහතින් දක්වා ඇත.

A - සංක්ෂිප්තව ප්‍රකාශ කිරිම
B - නිර්මාණාත්මකව අදහස් ප්‍රකාශ කිරිම
C - නැවුම් බවකින් යුක්ත වීම
D - පාඨක කුතුහලය දුරු කරන ලෙස රචනා ා කිරිම

ඉහත ප්‍රකාශ අතරින් නිදොස් ප්‍රකාශ වන්නේ,

(i) A, B, C, D යන සියල්ල ම.
(ii) B පමණි
(iii) B, C පමණි
(iv) D පමණි
(v) A, B, C පමණි

**පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024**

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

| 29 | S | I |
|---|---|---|

**නම :**

කාලය : පැය 3 යි, මිනිත්තු 10

❖ **ප්‍රශ්න පහකට පමණක්ම පිළිතුරු සපයන්න.**

(01) "සන්නිවේදනය නියාමනය කළ යුතු ක්‍රියාවලියකි."

1. සමාජයක් තුළ ක්‍රියාත්මක වන අවිධිමත් සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න. (ල. 4)
2. ජනසන්නිවේදන ක්‍රියාවලියේ දී ඇති විය හැකි බාධක වර්ග දෙකක් උදාහරණ මඟින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 8)
3. මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාවය කරුණු තුනක් මඟින් විස්තර කරන්න. (ල. 12)
4. සමාජ මාධ්‍ය නියාමනය කළ යුතු ය. පක්ෂව හා විපක්ෂව කරුණු දෙක බැගින් නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 16)

(02)
1. රූපණ සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීමට ඉවහල් වන කරුණු හතරක් නම් කරන්න. (ල. 4)
2. ග්‍රැහැම් වෝල්ස්ගේ නිර්මාණාත්මක චින්තනයට අදාළ පියවර හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 8)
3. පුවත්පතේ නිර්මාණාත්මක භාෂා භාවිතය එහි අන්තර්ගත ලිපි වර්ග තුනක් ඇසුරෙන් උදාහරණ මඟින් විස්තර කරන්න. (ල. 12)
4. රූපවාහිනී මාධ්‍ය හා සිනමා මාධ්‍ය සතු ලක්ෂණ හතරක් සන්සන්දනාත්මකව විස්තර කරන්න. (ල. 16)

(03)
1. සන්දේශයක් තුළ පවතින තොරතුරු වර්ග දෙක නම් කරන්න. (ල. 4)
2. ඥාන ව්‍යුහය ගොඩ නගා ගැනීමට ඉවහල් වන තොරතුරු හා දැනුම අතර වෙනස කරුණු දෙකක් මඟින් පැහැදිලි කරන්න. (ල. 8)
3. මාධ්‍ය මඟින් සංස්කෘතිය කෙරෙහි ඇති කරන බලපෑම කරුණු තුනක් මඟින් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 12)
4. ශ්‍රී ලංකාවේ මාධ්‍ය නියාමනය සඳහා පිහිටුවා ඇති ආයතන හතරක් නම් කර, ඒවායේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ල. 16)

(04)
1. සිද්ධි කළමනාකරණයේ පියවර හතර නම් කරන්න. (ල. 4)
2. මහජන සම්බන්ධතාවය දූන්වීම්කරණයෙන් වෙනස් වන ආකාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 8)
3. ජනමාධ්‍ය හා ප්‍රබල සම්බන්ධතාවයක් පවත්නා මාධ්‍ය සංස්කෘතියෙහි ලක්ෂණ තුනක් නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ල. 12)
4. වත්මන් සමාජය තුළ මහජන සම්බන්ධතාවය පවත්වාගෙන යාම සඳහා භාවිත කළ හැකි නව මාධ්‍ය විධික්‍රම 4 ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 16)

(05) 1. සිනමා අධ්‍යයනයේ දී විශේෂ අවධානයට ගත යුතු කරුණු හතරක් නම් කරන්න. (ල. 4)

2. පුද්ගලාන්තර සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා භාවිත කළ හැකි නිර්වාචික සන්නිවේදන විධික්‍රම දෙකක් පැහැදිලි කරන්න. (ල. 8)

3. අධ්‍යාපන කාර්යයට ජනමාධ්‍ය ප්‍රයෝජනයට ගත හැකි ආකාර තුනක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 12)

4. විචාරශීලි ග්‍රාහකත්වය බලසම්පන්න කිරීමට බලපාන සාධක හතරක් විස්තර කරන්න. (ල. 16)

(06) 1. සමාජානුයෝජන කාරක හතරක් නම් කරන්න. (ල. 4)

2. ගෝලීය සංස්කෘතිය නිසා සමාජයට ඇති වී තිබෙන අහිතකර බලපෑම් හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 8)

3. ආයතනයකට මහජන සම්බන්ධතාවය අවශ්‍ය වන අවස්ථා තුනක් නිදසුන් මඟින් පහදන්න. (ල. 12)

4. ජනමාධ්‍ය හා නව මාධ්‍ය අතර ඇති වෙනස්කම් හතරක් සංසන්දනාත්මකව විස්තර කරන්න. (ල. 16)

(07) 1. සංවර්ධනය පිළිබඳ ඩඩ්ලි සියර්ස්ගේ නිර්වචනය ලියන්න. (ල. 4)

2. සංවර්ධනය ජනතා කේන්ද්‍රීය වීමෙන් සැලසෙන වාසි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 8)

3. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටලුවක් වන දරිද්‍රතාවය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ල. 12)

4. ආයතනයක අභ්‍යන්තර මහජන සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් නිදසුන් මඟින් විස්තර කරන්න. (ල. 16)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## පිළිතුරු පත්‍රය.

### I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1) | 4 | (11) | 5 | (21) | 1 | (31) | 1 | (41) | 1 |
| (2) | 4 | (12) | 3 | (22) | 2 | (32) | 2 | (42) | 1 |
| (3) | 5 | (13) | 1 | (23) | 3 | (33) | 4 | (43) | 1 |
| (4) | 5 | (14) | 4 | (24) | 3 | (34) | 2 | (44) | 1 |
| (5) | 1 | (15) | 2 | (25) | 5 | (35) | 5 | (45) | 1 |
| (6) | 4 | (16) | 3 | (26) | 2 | (36) | 4 | (46) | 2 |
| (7) | 1 | (17) | 3 | (27) | 4 | (37) | 2 | (47) | 1 |
| (8) | 1 | (18) | 4 | (28) | 3 | (38) | 4 | (48) | 4 |
| (9) | 2 | (19) | 4 | (29) | 4 | (39) | 3 | (49) | 4 |
| (10) | 5 | (20) | 5 | (30) | 3 | (40) | 4 | (50) | 5 |

මුළු ලකුණු 1 x 50 = 50

### II පත්‍රය

(01) 1. (1) තොරතුරු වේගයෙන් ව්‍යාප්ත වේ.
(2) අවිධිමත් ධාරාවන් ඔස්සේ තොරතුරු ගලා යයි.
(3) සැකය හා කුතුහලය මත පදනම් වේ.
(4) මූලාශ්‍රය පැහැදිලි නොවීම
(5) නිශ්චිත කාලයක්, ස්ථානයක්, න්‍යාය පත්‍රයක් නොමැති වීම
(6) නිල ස්වභාවයක් සංදේශ තුළ දක්නට නොමැති වීම
(7) පණිවිඩය විකෘතිවීම්වලට හෝ විවිධ වෙනස්කම්වලට ලක් වීම

මුළු ලකුණු 1 x 4 = 4

2. (1) අර්ථ බාධක (2) මාධ්‍ය බාධක
ගැළපෙන උදාහරණ සමඟ පැහැදිලි කිරීමට ලකුණු 4 x 2 = 8

3. (1) මහජන සාමය ආරක්ෂා කිරීමට
(2) පාලනය නොකරන ලද පොදු මහජන සන්නිවේදන ක්‍රම මඟින් තනි පුද්ගලයන්ගේ අයිතීන්වලට සිදු වන බලපෑම පාලනයට.
(3) තොරතුරු සමාජයක පවත්නා විවිධ සන්නිවේදන විධික්‍රම යනු ආර්ථික සම්පතකි. ඒවා කළමනාකරණය කිරීමට.
(4) මාධ්‍ය සේවාවල නිදහස් වෙළඳපොළ භාවිතය, ප්‍රවේශ වීමේ තරඟකාරිත්වය, පාරිභෝගික අයිතිය යනාදිය පවත්වාගෙන යාමට.

අදාළ විස්තර කිරීම් නිවැරැදි නම්, 4 x 3 = 12

4. පක්ෂව

- අසත්‍ය කරුණු සමාජගත වීම නිසා
- අසභ්‍ය තොරතුරු හුවමාරු වීම නිසා
- තොරතුරුවල නිල ස්වභාවයක් නොමැති වීම
- ගැටලු ඇති වන ලෙස විරෝධාකල්ප දක්වීම නිසා

විපක්ෂව

- සිතැගියාවන් පළ කිරීමට නොහැකි වීම
- පුද්ගල නිර්මාණශිලිත්වය බෙදා හදාගත නොහැකි වීම
- විරෝධාකල්ප ප්‍රචලිත කිරීමට ඇති අවකාශ අඩු වීම

මුළු ලකුණු 4 x 4 = 16

(02) 1. (1) රූපන අවස්ථා නිරීක්ෂණය
(2) අනුකරණය
(3) විවිධ සන්නිවේදන අවස්ථා රූපනයෙන් ඉදිරිපත් කිරීම
(4) විවිධ අවස්ථා අනුව රූපණය වෙනස්වන ආකාරය අවබෝධ කර ගැනීම

මුළු ලකුණු 1 x 4 = 4

2. (1) සකස් කිරීම (2) පෝෂණය (3) ප්‍රදීපනය (4) සත්‍යාපනය

නම් කිරීමට 1 x 4 = 4, පැහැදිලි කිරීමට 2 x 2 = 4

3. (1) ප්‍රවෘත්ති
(තීරු ලිපි, කතු වැකි, විශේෂාංග ලිපි, කෙටි කතා, චිත්‍ර කතා, කාටූන්. පාඨක අදහස්)
(2) විශේෂාංග
(3) දැන්වීම්

උදාහරණ ඇත්නම් පමණක් සම්පූර්ණ ලකුණු පිරිනමන්න. 4 x 3 = 12

4.

| රූපවාහිනි මාධ්‍ය | සිනමා මාධ්‍ය |
|---|---|
| • ආලෝක මාධ්‍යයකි | • අඳුරු මාධ්‍යයකි |
| • සන්නිවේදන බාධක ඇති වේ | • සන්නිවේදන බාධකවලින් තොරව නැරඹිය හැකිය. |
| • මුදල් නොගෙවා ගෘහස්ථව නැරඹිය හැක | • මුදල් ගෙවා නැරඹිය යුතු ය. |
| • සාමාන්‍ය හඬ, කුඩා තිර සහිත ය. | • තීව්‍ර හඬ, පුළුල් තිර සහිත ය. |
| • සජීවි සංදේශ බහුල ය. | • ප්‍රබන්ධමය ස්වරූපයේ සංදේශ පවතී |
| • සම්ප්‍රේෂණ මාධ්‍යයකි | • ප්‍රක්ෂේපන මාධ්‍යයකි |
| • වාණිජ නිෂ්පාදන මත පදනම් වූ තොරතුරු මාධ්‍යයකි | • ප්‍රබල කළා මාධ්‍යයකි. |

මුළු ලකුණු 4 x 4 = 16

(03) 1. (1) සමාජයීය තොරතුරු (2) තත්‍ය තොරතුරු මුළු ලකුණු 2 x 2 = 4

2.

| තොරතුරු | දැනුම |
|---|---|
| • තොරතුරු නිරන්තරයෙන් වෙනස් වේ | • දැනුම කිසියම් ව්‍යුහයකට, ආකෘතියකට අනුව සකස් වේ. |
| • තොරතුරු පිළිබඳ මනා අවබෝධයක් නොමැත | • දැනුම පිළිබඳ මනා අවබෝධයක් ඇති වේ. |
| • තොරතුරු ක්ෂණයකින් අමතක වේ | • මනසේ තැන්පත් වේ |
| • තොරතුරු අර්ථකථනය කර ගත යුතු දෙයකි. | • දැනුම අර්ථකථනය කර ගත් දෙයකි. |

මුළු ලකුණු 4 x 2 = 8

3. (1) ආකල්ප වෙනස් වීම (2) හැසිරීම වෙනස් වීම (3) ප්‍රචණ්ඩත්වය
(4) ලෝලත්වය (5) සංස්කෘතික කම්පනය

මුළු ලකුණු 4 x 3 = 12

4. (1) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය
(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
(3) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
(4) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
(5) ශ්‍රී පරිගණක හදිසි ප්‍රතිචාර සංසදනය

මුළු ලකුණු 4 x 4 = 16

(04) 1. (1) සැලසුම (2) පිළියෙල කිරීම (3) විමසුම (4) ක්‍රියාව

මුළු ලකුණු 1 x 4 = 4

2.

| දැන්වීම්කරණය | මහජන සම්බන්ධතාවය |
|---|---|
| • අලෙවිකරණ කාර්යයකි | • කළමනාකරණ කාර්යයකි |
| • සෘජු මුදලක් වැය වේ | • මුදලක් වැය නොවේ |
| • ජනමාධ්‍ය භාවිත කරයි | • ජනමාධ්‍ය හා යන්ත්‍ර සහායක සන්නිවේදන ක්‍රමෝපායන් භාවිත කරයි. |

මුළු ලකුණු 4 x 2 = 8

3. (1) මාධ්‍ය සංස්කෘතිය ගතික වේ.
(2) මාධ්‍ය සංස්කෘතිය වඩාත් ආකර්ශනීය වේ.
(3) මාධ්‍ය සංස්කෘතිය ජන සංස්කෘතිය ඉක්මවා යයි.
(4) ව්‍යාපාරික ආධිපත්‍යයන් සමග බැඳී පවතී
(5) තාක්ෂණය සමග ප්‍රබල සම්බන්ධතාවයක් පවතී
(6) ජනමාධ්‍ය මඟින් ව්‍යාප්තිය සිදු වේ.
(7) සෑම විට ම කාලීන තත්ත්වයන් මත ගොඩ නැගේ.
(8) මාධ්‍ය සංස්කෘතිය විසින් සමාජය වෙනස් කරයි.

මුළු ලකුණු 4 x 3 = 12

4. (1) වෙබ් අඩවි (2) සමාජ ජාල (3) විද්‍යුත් තැපැල (4) Youtub
(5) කෙටි පණිවිඩ (ස්මාර්ට් ජංගම දුරකථනයකින්)

මුළු ලකුණු 4 x 4 = 16

(05) 1. (1) සිනමා තිර රචනය (2) අධ්‍යක්ෂණය
(3) සිනමා තාක්ෂණය (4) සංස්කරණය

මුළු ලකුණු 1 x 4 = 4

2. (1) ඇස් සම්බන්ධතාවය (2) අංග චලනය (3) මුහුණේ භාව ප්‍රකාශන
(4) ශරීර ඉරියව් (5) අවකාශය

මුළු ලකුණු 4 x 2 = 8

3. (1) නිර්මාණාත්මක භාෂා කුසලතා වර්ධනය කර ගැනීමට
(2) විවිධ ලේඛන රටා හඳුනා ගැනීම
(3) භාෂාව නිවැරැදි ලෙස උච්චාරණය කිරීම
(4) රූප භාෂාව මඟින් වචනාර්ථ තේරුම් ගැනීම
(5) සම්මත භාෂාව හා ව්‍යවහාර භාෂාව හඳුනා ගැනීම
(6) න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව දැක බලා ගැනීමට

මුළු ලකුණු 4 x 3 = 12

4. (1) විශ්ලේෂණය (2) ඇගයීම (3) කාණ්ඩකරණය (4) අනුමානය
(5) නිගමනය (6) සංස්ලේෂණය (7) වියුක්තිකරණය

මුළු ලකුණු 4 x 4 = 16



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(06) 1. (1) පවුල (2) පාසල (3) සම වයස් කණ්ඩායම්
(4) ආගමික මධ්‍යස්ථාන (5) ජනමාධ්‍ය (6) විවිධ සංවිධාන
(7) විශ්වවිද්‍යාල

මුළු ලකුණු 1 x 4 = 4

2. (1) අන්තර්ජාතික න්‍යාය පත්‍රයකට අනුව හැඩ ගැසීම
(2) ජාතික රාජ්‍ය අනන්‍යතා අභියෝගයකට ලක් වීම
(3) නව සංස්කෘතික රටාවක් නිර්මාණය කිරීම
(4) පාරජාතික හා බහු ජාතික සමාගම්වල ක්‍රියාකාරිත්වය වැඩි වීම

නම් කිරීමට 1 x 4 = 4, පැහැදිලි කිරීමට 2 x 2 = 4

3. (1) නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමට
(2) තරඟකාරිත්වයක් පවතින අවස්ථාවක ප්‍රතිවිරෝධය ජය ගැනීමට
(3) ආයතනයක් වෙත ඇති වන අයහපත් ව්‍යාජ ප්‍රසිද්ධිය මත ප්‍රතිරූපයට වන හානි අවම කිරීමට
(4) තර්ජනීය තත්ත්ව පාලනය කර ගැනීමට
(5) ව්‍යසන හා ආපදා තත්ත්වයක දී අදාළ දැනුම්වත් කිරීමට
(6) ආයතනයනික හා එහි පාර්ශවකරුවන් අතර ඇති වන මතභේදාත්මක තත්ත්ව සමනය කිරීම

මුළු ලකුණු 4 x 3 = 12

4.

| ජනමාධ්‍ය | නව මාධ්‍යය |
|---|---|
| • පහසුවෙන් පරිශීලනය කළ හැකි ය. | • පරිශීලනය කිරීමට විශේෂ දැනුමක් අවශ්‍ය වේ |
| • හිමිකාරිත්වය නිශ්චිත වේ | • හිමිකාරිත්වය හැම විට ම දෘෂ්‍යමාන නොවේ. |
| • ප්‍රමාදිත ප්‍රතිපෝෂණයකි | • ක්ෂණික ප්‍රතිපෝෂණයකි |
| • වාරණය කිරීම පහසු ය | • වාරණය කිරීම අපහසු ය. |
| • නියාමනය කිරීම පහසු ය. | • න්‍යායාමනය කිරීම අපහසු ය |
| • වෘත්තීමය සන්නිවේදකයින් සිටී | • පුරවැසි මාධ්‍යකරණයට ඉඩ පවතී |

මුළු ලකුණු 4 x 4 = 16

(07) 1. රටක දුප්පත්කම, අසමානතාව හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීමයි. ලකුණු 4
-ඩඩ්ලි සියර්ස්-

2. (1) ජනතා අදහස්, මතවාද, යෝජනා දැන ගත හැකි වීම
(2) ජනතාවට අවශ්‍ය වන පරිදි සංවර්ධන ක්‍රියාදාමයන් සැලසුම් කළ හැකි වීම
(3) ජනතා සහභාගිත්වය සක්‍රිය කරවීම
(4) ජනතාව බලගැන්වීමට

මුළු ලකුණු 4 x 2 = 8

3. (1) ස්ථිරසාර ජීවනෝපායක් ඇති කිරීම
(2) ව්‍යවසායික අවස්ථා වැඩිදියුණු කිරීම
(3) දරිද්‍රතාවයෙන් ජීවත් වන ජනතාව හා ඔවුන්ගේ සංවිධාන බල ගැන්වීම
(4) ජාත්‍යන්තර සහයෝගීතාවය ශක්තිමත් කිරීම
(5) අධ්‍යාපන පහසුකම් තහවුරු කිරීම
(6) තමන්ගේ ම ශක්තියෙන් නැගී සිටීමට නොහැකි අයට උපකාර සඳහා වූ ප්‍රවේශ වැඩි කිරීම

මුළු ලකුණු 4 x 3 = 12

4. (1) චාරිකා සංවිධානය (2) අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය
(3) පුවත් හසුන (4) යෝජනා පෙට්ටිය
(5) සුහද හමු (6) විවිධ උත්සව සංවිධානය
(7) වැඩමුළු සංවිධානය (8) ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරීම

මුළු ලකුණු 4 x 4 = 16

(14) WWW.PastPapers.WiKi (14)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**